# ශ්‍රී ලංකාවේ ජන වර්ග අනුව උපත් අතර පරතරයේ වෙනස්කම් හා ඊට බලපාන හේතු සාධක

ජී.ඒ.ඩී. දිල්රුක්ෂි - ප්‍රජාවිද්‍යා අධ්‍යයනාංශය

බහු වාර්ගික රටක් ලෙස ශ්‍රී ලංකාවේ එක් එක් ජන වර්ගයට අයත් කාන්තාවන්ගේ සඵලතාව නොහොත් දරු උපත් පිළිබඳ සමාජ කතිකාවක් ඇති වී තිබේ. ජන වාර්ගික පදනම මත එක් එක් ජන වර්ගයන්හි සමාජ, ආර්ථික, සංස්කෘතික හා ප්‍රජාවිද්‍යාත්මක පසුබිම් එකිනෙකට වෙනස් වන අතර ඒ අනුව සඵලතා හැසිරීම්ද, ජන වර්ග අනුව වෙනස් වන්නේදැයි අධ්‍යයනය කළ යුතුය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජන වර්ගවල උපත් අතර පරතරයේ වෙනස්කම් හා ඒ සඳහා බලපාන හේතු සාධක අධ්‍යයනය කිරීමයි. මේ සඳහා ද්විතීයික දත්ත මූලාශ්‍රයක් වන 2016 ප්‍රජාවිද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණ දත්ත භාවිත කරන ලදි. අධ්‍යයන ප්‍රතිඵල මඟින් සඵලතාව සම්පූර්ණ කරන ලද එනම් වයස අවුරුදු 45-49 වයස් කාණ්ඩයේ කාන්තාවන්ගෙන් ජන වාර්ගිකත්වය මත පළමු හා දෙවන දරුවාගේ වැඩිම උපත් අතර කාල පරතරය වාර්තා වන්නේ මුස්ලිම් ජන වර්ගයෙන් වන අතර අඩුම උපත් අතර කාල පරතරය ශ්‍රී ලංකා දෙමළ ජන වර්ගයට අයත් කාන්තාවන්ගෙන් වාර්තා වේ. මෙහිදී අධ්‍යයනය කරන ලද මෙම සියලු ජන වර්ගවලට අයත් කාන්තාවන් අතරින් 65% දරු උපත් අතර කාල පරතරය රඳවා ගැනීමට විසංග්‍රාහක ක්‍රම භාවිතා කර තිබේ. ජන වර්ග අනුව උපත් අතර පරතරයේ වෙනස්කම් සඳහා බලපාන හේතු සාධක අධ්‍යයනයේ දී අධ්‍යාපනය, පදිංචි ස්ථානය හා ආගම යන කරුණු කෙරෙහි මූලික අවධානය යොමු කරන ලද අතර එහිදී අධ්‍යාපන මට්ටම ඉහළ යාම මත මුස්ලිම් කාන්තාවන්ගේ උපත් අතර පරතරය ඉහළ ගොස් ඇති බවත්, පදිංචියේ බලපෑම මත ශ්‍රී ලංකා දෙමළ ජන වර්ගයේ උපත් අතර කාල පරතරය අඩු වී ඇති බවත් වාර්තා වේ. විශ්ලේෂිත මෙම කරුණු මත ශ්‍රී ලංකාවේ ජන වර්ග අනුව සඵලතාව සම්පූර්ණ කරන ලද කාන්තාවන්ගේ දරු උපත් අතර කාල පරතරයේ වෙනස්කම් සඳහා අධ්‍යාපනය හා පදිංචිය සෘජුව බලපා ඇති බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** *ජන වර්ගය, උපත් අතර කාල පරතරය, විසංග්‍රාහක ක්‍රම*